fairfirst INSURANCE
A FAIRFAX Company

# මෝසම් කාලයේ ආපදාවන්ගෙන් ආරක්ෂා වීමට

## ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් වෙතින් උපදෙස්

v 1.0 - 21/05/2020



# ශ්‍රී ලංකාවේ ගංවතුර අවදානම කෙබඳුද?

මේ වනවිට ශ්‍රී ලංකාවේ නිතර ගංවතුර උවදුරු ඇතිවේ. පසුගිය කාලය තුළ වසරක් පාසා ගංවතුර තත්ත්වයන් වාර්තා වී ඇත.

මැයි මාසය ළඟා වෙමින් පවතින නිසා, COVID-19 වසංගතයෙන් රට පීඩාවට පත්වී ඇති මේ මොහොතේ, ගංවතුර නිසා ඇතිවිය හැකි ආපදා තත්ත්වයන් පාලනය කිරීම අන් කවරදාටත් වඩා වැදගත්ය.

# වසංගතයක් පවතින කාලයක ගංවතුර වැනි ස්වාභාවික විපත් වලින් ආරක්ෂා වන්නේ කෙසේද?

ආපදා තත්ත්වයන් පාලනය කිරීමේදී එකිනෙකා සමග සමීපව සම්බන්ධ වී කටයුතු කිරීමට සිදුවේ. එහෙත් COVID-19 තත්ත්වය නිසා අපට සමාජ දුරස්ථකරණ සීමාවන් පවත්වා ගැනීමට සිදුවී ඇත. එම නිසා, අපගේත් සහන සේවකයන්ගේත් ජීවිත අනතුරේ නොදැමීමට නම් අප නව ක්‍රමවේද සොයාගත යුතුය.



**ගංවතුර සහ COVID-19 උවදුරු වලින් ආරක්ෂා වීම සඳහා පහත සඳහන් විධිවිධාන අනුගමනය කරන්න.**

**හදිසි අවස්ථාවක රැගෙන යාමට භාණ්ඩ කට්ටලයක් සූදානම් කරගන්න** - මෙම කට්ටලයට මුහුණු ආවරණ, අත් ආවරණ, දෑත් පවිත්‍රකාරක, ජලය, ආහාර, අත්‍යවශ්‍ය ඖෂධ සහ ජාතික හැඳුනුම්පත ඇතුළත් විය යුතුය.


**ආරක්ෂාකාරී ස්ථානයක් වෙත යන්න** - ගංවතුර සම්බන්ධ අනතුරු ඇඟවීම් නිකුත් කර ඇත්නම් හෝ දැඩි වර්ෂාපතනය දිගටම පවතී නම්, ආරක්ෂාකාරී ස්ථානයක් වෙත යන්න. COVID-19 පැතිරීම අවම කරගැනීම සඳහා, පොදු ස්ථාන වෙනුවට ඥාතියෙකුගේ හෝ මිතුරෙකුගේ නිවසක් වෙත යාම සුදුසු වේ.

**සෑම විටම සමාජ දුරස්ථකරණ සීමාවන් පවත්වාගන්න** - සහන සේවකයන්ගේ සහය ලබාගැනීමට සිදුවන අවස්ථාකදී සෑම විටම මුහුණු ආවරණ හා අත් ආවරණ පැළඳ සිටින්න. රෝගී තත්ත්වයක් මතුවේ නම් වහාම නිසි බලධාරීන්ට ඒ බව දැනුම් දෙන්න.

**ඔබගේ සහයෝගය උපරිමයෙන් ලබාදෙන්න** - ඔබට පොදු ස්ථානයක් වෙත යන ලෙස දන්වන ලද්දේ නම්, ආරක්ෂාව සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කුමක්දැයි විමසා දැනුවත් වී, ඔබගේ උපරිම සහයෝගය ලබාදෙන්න.

## ආරක්ෂාකාරී ස්ථානයක් වෙත යනතුරු ඔබගේ නිවස ආරක්ෂා කරගන්නේ කෙසේද?

- විදුලි සැපයුම විසන්ධි කරන්න.
- පාවී යාමට ඉඩ ඇති භාණ්ඩ බර තබා හෝ ගැටගසා තබන්න.
- වීදුරු කැබලි විසිරී යාමේ අවදානම වළක්වා ගැනීම සඳහා වීදුරු භාණ්ඩ ප්ලාස්ටික් බෑග් තුළට දමා ගැටගසන්න.
- ගෘහ භාණ්ඩ ප්‍රවේශමෙන් ඇඳන් මත තබන්න. ඉන්පසු ඔබ සතු අනෙකුත් භාණ්ඩ ඒවා මත තබන්න.
- එහා මෙහා කළ නොහැකි විදුලි උපකරණ පේනු වලින් ගලවා තබන්න.




# ගංවතුරකට පසු
# ආරක්ෂාව සඳහා ගතයුතු ක්‍රියාමාර්ග

- ආපසු නිවසට පැමිණීමේදී පරීක්ෂාකාරී වන්න. ගංවතුර නිසා ගෙබිම හා එළිමහනේ වීදුරු කටු සහ වෙනත් සුන්බුන් විසිරී තිබීමට ඉඩ තිබේ.
- COVID-19 සහ වෙනත් රෝග අවදානම් වළක්වාගැනීම සඳහා නිවස හා ඉඩම විෂබීජහරණය කිරීමට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ හෝ වෙනත් ප්‍රාදේශීය බලධාරීන්ගේ සහය ලබාගන්න.
- ගංවතුරට හසුවී තිබීමට ඉඩ ඇති විදුලි උපාංග ඇල්ලීමෙන් වළකින්න.
- තෙත්වී ඇති සියලුම දේවල් පිරිසිදු කරන්න. ගංවතුර සමග අපවිත්‍ර ජලය, හානිකර රසායන ද්‍රව්‍ය සහ ජීවී වර්ග ආදිය පැමිණ තිබීමට ඉඩ ඇත.
- නිවසේ විදුලි පද්ධතිය පරීක්ෂා කරන්න. විදුලි උපාංග හා පේනු ආදිය ඇතුළත ජලය සිරවී තිබීම මගින් හානි සිදුවීමට ඉඩ ඇත. විදුලි පරිපථ හා උපකරණ හොඳින් වියළීමට ඉඩ හැර භාවිතා කරන්න.
- මෝටර් සහ ස්විච් වල පරිවරණ ප්‍රතිරෝධය (insulation resistance) පරීක්ෂා කරන්න. අඩු බව පෙනී යන්නේ නම් විදුලි කාර්මිකයෙකු ලවා අවශ්‍ය අලුත්වැඩියාවන් සිදුකර ගන්න.
- පානය සඳහා උණු කර නිවාගත් ජලය භාවිතා කරන්න.
- හානි වී ඇති දේවල් වල ලැයිස්තුවක් සකස් කර, ඔබගේ රක්ෂණ සමාගම වෙත දැනුම් දෙන්න.



# ගංවතුරකදී ඔබගේ ව්‍යාපාරය
# ආරක්ෂා කරගන්නේ කෙසේද?



**පවතින COVID-19 වසංගත තත්ත්වය නිසා ක්ෂණිකව පියවර ගැනීම දුෂ්කර විය හැක. එහෙත් ඔබ සිටින්නේ නිතර ගංවතුරට හසුවන ප්‍රදේශයක නම්, දැන්ම සූදානම් වන්න!**

- රසායන ද්‍රව්‍ය (පළිබෝධනාශක, වල් නාශක, උෂ්ණත්වය ඇතිකරන ද්‍රව්‍ය, විෂ සහිත ද්‍රව්‍ය හා ජලය සමග මිශ්‍ර වූ විට වහා ගිනිගන්නා ද්‍රව්‍ය) ජලය ඇතුළු නොවන ඇසුරුම් තුළ බහා ඉහළ ස්ථානයක තබන්න.
- වටිනා යන්ත්‍රෝපකරණ ආරක්ෂා කරගැනීම සඳහා ඒවා ජලය ඇතුළු නොවන බහාලුම් තුළ බහා පැලට් මත තබන්න.
- ගංවතුරට පසුව තම ආරක්ෂාව සලසා ගනිමින් ව්‍යාපාරික ස්ථානය නැවත සැකසීමේ හැකියාව ඇති කිහිප දෙනෙකු සඳහා ඇඳිරි නීති බලපත්‍ර සූදානම් කරගන්න.
- කාලගුණ තත්ත්වය හා ගංවතුර තත්ත්වය දිගටම අයහපත්ව පවතී නම් ව්‍යාපාරයට අයත් භාණ්ඩ රැගෙන ගොස් ගබඩා කිරීම සඳහා විකල්ප ස්ථානයක් සූදානම් කරගන්න.
- ඔබ රාක්ක ක්‍රමයක් භාවිතා කරන්නේ නම්, පහළ රාක්ක වල ඇති භාණ්ඩ ඉහළ රාක්ක වල අසුරන්න.
- ජලය ඇතුළු විය හැකි ස්ථාන අවහිර කිරීම සඳහා වැලි කොට්ට යොදන්න.

# දීර්ඝකාලීන පූර්ව-ආරක්ෂණ ක්‍රමවේද

- ඉක්මනින් ඉහළ මහලක් වෙත රැගෙන යාහැකි ආකාරයේ සැහැල්ලු සහ ගලවා එකලස් කළ හැකි ගෘහභාණ්ඩ මිලදීගැනීමට අවධානය යොමුකරන්න.
- ජලය ගබඩා කරන ස්ථාන සහ අප-ජලය බැහැර කිරීමේ පද්ධති ආදිය සඳහා, ජලය ආපසු ගලා ඒම වළක්වන ආකාරයේ වෑල්ව යොදන්න. ගොඩනැගිල්ල ඇතුළත රැස්වන ජලය බැහැරට පොම්ප කිරීම සඳහා නිසි ස්ථාන වල වළවල් සකසා, ජලයේ ගිල්විය හැකි පොම්ප ඒවායෙහි සවිකරන්න.



## වැදගත් කරුණු:

- ඔබගේ රථය නවත්වා තිබියදී ගංවතුරට යටවූයේ නම්, එය පණගැන්වීමට උත්සාහ නොකරන්න. නිල නියෝජිත සමාගම හෝ සුදුසුකම් සහිත කාර්මිකයෙකු කැඳවා එය පරීක්ෂාවට ලක්කරන්න.
- ජලය පිරී ඇති ස්ථාන වලදී රථය නැවතුණහොත් ප්‍රවේශම් වන්න. එන්ජිම දෙසට ජලය ඇදී යාමෙන් රථයට බරපතළ හානි ඇතිවීමට ඉඩ තිබේ.
- ගංවතුර තත්ත්වයක් පවතින ප්‍රදේශ වෙත ගමන් කරන්නේ නම් විකල්ප මාර්ග භාවිතා කරන්න.



